මාධ්‍ය නිවේදන අංක 05

## මැතිවරණ කොමිෂන් සභාව

### 2022.03.08 දින රැස් වූ මැතිවරණ කොමිෂන් සභාව මතු දැක්වෙන තීරණ ගෙන ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ

- 2022 වර්ෂයේ දී පිළිගත් දේශපාලන පක්ෂයක් වශයෙන් මැතිවරණ කොමිෂන් සභාවේ ලියාපදිංචි වීම සඳහා අයදුම්පත්‍ර 76ක් ලැබී ඇති අතර, මෙම අයදුම්පත්‍ර සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සිදුකිරීම ආරම්භ කිරීම.

- ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා අශක්නුතාවට පත් තැනැත්තකුට වෛද්‍ය සහතිකයක් ඉදිරිපත් කොට සහායකයකු කැටුව යාමට මැතිවරණ පනත්වලින් ප්‍රතිපාදන ලබා දී තිබේ. පළමුවරට එවැනි වෛද්‍ය සහතිකයක් ඉදිරිපත් කොට ඡන්දය ප්‍රකාශ කරන තැනැත්තකුට ඉන් අනතුරුව පැවැත්වෙන ඡන්ද විමසීම්වල දී නැවත වෛද්‍ය සහතිකයක් ඉදිරිපත් කිරීමකින් තොරව එම තැනැත්තන් සඳහා විශේෂ හැඳුනුම්පතක් මැතිවරණ කොමිෂන් සභාව විසින් නිකුත් කිරීම.

- 2022 වර්ෂයේ ඡන්ද හිමියන්ගේ දිනය සැමරීමේ ජාතික උත්සවය අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් 2022 මාර්තු මස 11 දින පස්වරු 4.00ට කොළඹ ගලධාරී හෝටලයේ දී පැවැත්වීම.

මැතිවරණ කොමිෂන් සභාවේ නියමය පරිදි

සමන් ශ්‍රී රත්නායක
මැතිවරණ කොමසාරිස් ජනරාල්

මැතිවරණ කොමිෂන් සභාව,
සරණ මාවත,
රාජගිරිය.
2022 මාර්තු මස 08